<u>කාර්ය පත්‍රිකාව</u>

1. පන්තිය : 8 ශ්‍රේණිය    විෂය : විද්‍යාව    අදාල සතිය : 02 සතිය පෙබරවාරි

2. ඒකකය : 03  ශාක කොටස් වල විවිධත්වය හා කෘත්‍ය

3. **ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:**

   I. විද්‍යාව පෙළ පොතේ 03 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

   II. ඔබේ ගෙවත්තේ ඇති විවිධ ශාක වල කඳන් හොඳින් නිරීක්ෂණය කරන්න.

   III. එකිනෙකට වෙනස් වූ ශාක කඳන් වල රූප සටහන් අඳින්න.ඒවායේ නම් ලියන්න.

   IV. විවිධ කෘත්‍ය සඳහා  අනුවර්තනය වූ ශාක කඳන්  පිළිබඳ වාර්තාවක් සකසන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

   I. **e -නැණපියස:**

   - https://www.wordwall.net/play/17817/512/810
   - https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18808&forceview=1

   II. **e- තක්සලාව :**

   - https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si
   - https://www.ethaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=43820

III. **You tube :**

- https://www.youtube.com/watch?v=bST4medgUCw

**5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :**

i. ශාකයක ප්‍රධාන කොටස් ගවේෂණය කර ඒවායේ රූප සටහන් අඳියි.

ii. ශාකයක ප්‍රධාන කොටස්වල මූලික කෘත්‍ය විස්තර කරයි.

iii. ශාක වල විවිධත්වයට තුඩු දෙන අනුවර්තන පැහැදිලි කරයි.

iv. ශාකයක ප්‍රධාන කොටස්වල අනුවර්තන ඒවායේ සුවිශේෂී කෘත්‍ය වලට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් පරිසරය විමර්ශනය කරයි.

v. සුවිශේෂී අනුවර්තන සහිත ශාක වල, කඳන් නිරීක්ෂණය කොට අඳියි.

vi. ශාකවල විවිධ කොටස්වල විවිධත්වය අගය කරයි.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

**i.** වායව කඳන් යනු මොනවාද? උදාහරණ 03 ක් ලියන්න.

**ii.** භූගත කඳන් යනු මොනවාද? උදාහරණ 03 ක් ලියන්න.

**iii.** ශාකයක කඳ මඟින් ශාකයට ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයන් 04 ක් ලියන්න.

**iv.** ඉහත කාර්යයන්ට අමතරව වෙනත් කාර්යයන් ඉටු කිරීම පිණිස හැඩ ගැසුණු ශාක කඳන් ද ඇත.පහත දැක්වෙන කාර්යයන් කඳ මඟින් ඉටු වන ශාකය බැගින් ලියන්න.

1. තම වර්ගයා බෝ කිරීම (ප්‍රචාරණ කඳන්)

   - වායව කඳන් මගින් ප්‍රචාරණය වන - ............................
   - භූගත කඳන් මඟින් ප්‍රචාරණය වන-..............................

2. ආහාර ගබඩා කිරීම ( සංචිත කඳන්)

- වායව කඳේ ආහාර ගබඩා කරන - .................................
- භූගත කඳේ ආහාර ගබඩා කරන - ..................................

3. ප්‍රභාසංශ්ලේෂණය කිරීම (ස්කන්ධාභ)

.............................................................................................